**සොරණාතොට ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 ජුනි 03 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 ජුනි 19 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 16 දින සභාවේ සභාපති වෙත නිකුත් කරන ලදි.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට සොරණාතොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ශුද්ධ වත්කම්වල අඩුවීම

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ දී ශුද්ධ වත්කම්වල වටිනාකම රු.641,459,663 ක් වූ අතර ඉකුත් වර්ෂය අවසානයේදී ශුද්ධ වත්කම්වල වටිනාකම රු.642,251,003 ක් වූයෙන් ශුද්ධ අඩුවීම රු.791,340 ක් විය.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරිගේ 2013 මැයි 28 දිනැති ක්‍රමක්ෂය ලේඛණය අනුව සංශෝධිත ණය මුදල රු.8,834,609 ක් වුවද, ශේෂපත්‍රයේ එය රු.8,358,593 ක් ලෙස දැක්වීම නිසා ණය ශේෂය රු.476,016 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය මුදල වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ගෙවිය යුතු පොලිය රු.763,242 ක් ගිණුම්ගත නොකිරීම නිසා වියදම රු.763,242 ක් ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතු රු.1,056,999 ක් සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන නොසැලසීම නිසා බැරකම් රු.1,056,999 ක් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල රු.8,540,442 ක් වූ වැටුප් ප්‍රතිපූර්ණ අදාල වැඩසටහන් යටතේ වෙන්කර ගිණුම්ගත නොකර පොදු පරිපාලනය යටතේ මුළු මුදලම දක්වා තිබුණි.

#### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු. 10,661,868 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල එකතුව රු.17,567,057 ක් විය.

### 1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු.643,401,588 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.5 **නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත හා ඒ අනුව ප්‍රකාශයට පත්කල අංක 1523/16 දරන 2008 ජනවාරි 25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය | 2013 වර්ෂය සඳහා සභාවෙන් වෙළඳ බලපත්‍ර ලබාගෙන තිබුණු ව්‍යාපාර 12 ක් අදාල ගැසට් පත්‍රයේ (ඇ) උපලේඛණය යටතට ගැනෙන ව්‍යාපාරද යන්න සමීක්ෂණයක් මඟින් හඳුනාගෙන පරිසර බලපත්‍ර නිකුත් කර නොතිබුණි. |
| (ආ) | 2006 අංක 12 දරන මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනත | 2013 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා කාලය තුල රැස්කල රු.25,366 ක මුද්දර බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වරයා වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371 | සභාව විසින් 2012 හා 2013 වර්ෂවලදී සභාවේ නිලධාරීන් වෙත අවස්ථා 12 කදී ගෙවන ලද රු.39,667 ක අත්තිකාරම් මුදල් රෙගුලාසිය ප්‍රකාරව පියවා නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්තිය | සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලබාගිය හා සේවය හැර ගිය සේවකයින් 10 දෙනෙකුගෙන් 2011 වර්ෂයේ සිට අය නොවී පවතින රු.26,587 ක සේවක ණය අයකර ගෙන නොතිබුණි. |

## 2. **මූල්‍ය සමාලෝචනය**

### 2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.11,638 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ

ආදායම රු.1,180,202 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,191,840 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ අඩුවීම පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනයක් පහත දැක්වේ.

| පුනරාවර්තන ආදායම | 2013 | 2012 | විචලනය | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| වරිපනම් හා බදු | 3,828,127 | 4,798,831 | (970,704) | |
| කුලී | 470,400 | 640,092 | (169,692) | |
| බලපත්‍ර ගාස්තු | 484,240 | 531,011 | (46,771) | |
| සේවා සඳහා ගාස්තු | 1,010,143 | 1,360,301 | (350,158) | |
| වරෙන්තු ගාස්තු හා දඩ | 378,228 | 337,381 | 40,847 | |
| වෙනත් ආදායම් | 141,818 | 331,342 | (189,524) | |
| ආදායම් ආධාර | 8,540,442 | 6,981,079 | 1,559,363 | |
| | | | ------------- | (126,629) |
| **පුනරාවර්තන වියදම** | | | | |
| වැටුප් හා දීමනා | 11,181,564 | 9,784,369 | (1,397,195) | |
| ගමන් වියදම් | 199,716 | 209,299 | 9,583 | |
| සැපයුම් හා උපකරණ | 598,205 | 1,059,058 | 460,853 | |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 923,922 | 540,732 | (383,190) | |
| ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 1,518,026 | 1,341,257 | (176,769) | |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 15,000 | 420,349 | 405,349 | |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 306,643 | 420,333 | 113,690 | |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 121,959 | 24,437 | (97,522) | |
| | | | ----------- | (1,065,201) |
| | | අවාසිදායක විචලනය | | (1,191,840) |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

වරිපනම් හා අක්කර බදු අයකිරීමේ ප්‍රගතිය පහල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

### 2.3.2 බදු කුලී

පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සභාව සතු කඩ කාමර 25 ක් සඳහා මාසික බදු කුලී, ප්‍රධාන තක්සේරුකරු හෝ පළාත් පාලන ආයතන සම්බන්ධ තක්සේරුකරුවකු මගින් තක්සේරු කරවාගෙන නොතිබුණි.

### 2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවිදඩ හා මුද්දර ගාස්තු පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 655,508 |
| මුද්දර ගාස්තු | 447,041 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

3.1 **නිෂ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්**

---------------------------------------

ඇම්පියර් 13.5 ක වතුර මෝටරය (සීරියල් අංක A 7576 F) 2012 වර්ෂයේ සිට අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

----------------------------------------

**අයවැය පාලනය**

-----------------

සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී පහත පරිදි විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

| | අයවැයගත | තථ්‍ය | විචලනය | විචලන ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන ආදායම | | | | |
| බලපත්‍ර ගාස්තු | 900,000 | 484,240 | 415,760 | 46 |
| සේවා සඳහා ගාස්තු | 1,365,000 | 1,010,143 | 354,857 | 26 |
| වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 630,000 | 378,229 | 251,771 | 40 |
| වෙනත් ආදායම් | 480,000 | 141,818 | 338,182 | 70 |
| පුනරාවර්තන වියදම් | | | | |
| වැටුප් හා දීමනා | 9,095,000 | 11,181,564 | 2,086,564 | 23 |
| ගමන් වියදම් | 450,000 | 199,716 | 250,284 | 56 |
| සැපයුම් හා උපකරණ | 691,760 | 598,205 | 93,555 | 13 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 720,000 | 923,922 | 203,922 | 28 |
| ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 1,363,000 | 1,518,026 | 155,026 | 11 |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 25,000 | 15,000 | 10,000 | 40 |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 605,500 | 306,643 | 298,857 | 49 |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 25,000 | 121,959 | 96,959 | 388 |

5. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය